**චක්‍ර ලේඛ අංක 10/2015**


RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk


## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
**பதிவாளர் நாயகத் திணைக்களம்**
**REGISTRAR-GENERAL'S DEPARTMENT**

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**


වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3,
ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2015.12.10

සියළුම උප්පැන්න, මරණ සහ වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරුන්,

**<u>රෝහල් තුලදී සිදු වන උපතක් සම්බන්ධ විස්තර සැපයීම (B -148)</u>**

රෝහල් තුළ සිදුවන දරු උපත් පිළිබඳ තොරතුරු වාර්තා කිරීමට "රෝහලේදී සිදු වන උපතක් සම්බන්ධ විස්තර (B 148)" ආකෘතිය භාවිතා කල යුතු බවට උපදෙස් අඩංගු චක්‍රලේඛයක් මේ වන විට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළුම රජයේ හා පෞද්ගලික රෝහල් වෙත නිකුත් කර ඇත.

02. එබැවින් රෝහලක සිදුවූ දරු උපතකට අදාලව උප්පැන්නයක් ලියාපදිංචි කිරීමේදී ඔබ විසින් "රෝහලේදී සිදු වන උපතක් සම්බන්ධ විස්තර (B 148)" ආකෘතිය පරික්ෂා කර බැලිම අවශ්‍ය වන අතර ඊට අදාලව උපතක් ලියාපදිංචි කිරිම සදහා විස්තර සපයන(CR1) ප්‍රකාශ පත්‍රයද නිවැරදිව සම්පූර්ණ කර ලබා ගැනීමට කටයුතු කරන්න.

03. ඒ අනුව රෝහලක සිදුවූ උපතක් ලියාපදිංචි කළ විට, උපතක් ලියාපදිංචි කිරිම සදහා විස්තර (CR1) ආකෘතිය සහ රෝහලේදී සිදු වන උපතක් සම්බන්ධ විස්තර සපයන (B 148) ආකෘතිය යන ලේඛන දෙකම, උප්පැන්න ලේඛනයේ දෙවන පිටපත සමඟ එකට අමුණා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත භාරදීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

**ඊ. එම්. ගුණසේකර**
**රෙජිස්ට්‍රාර් ජනරාල්**

පිටපත්:-

1. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරින් - කරුණාකර දැනගැනීම සදහා
2. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් - මධ්‍යම ලේඛනාගාරය - අවශ්‍ය කටයුතු සඳහා
3. කලාප භාර සියළුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරුණාකර අ.ක.ස. සහ දැ.ගැ.ස.
4. සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - කරුණාකර අ.ක.ස. සහ දැ.ගැ.ස.